www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ හෙල උරුමයේ ස්වභාවය පිළිබඳව ලිපි හුවමාරුවක්

## An exchange over the nature of the JHU in Sri Lanka

**2005 ජුනි 7**

*පහත පල වන්නේ “ශ්‍රී ලංකාවේ අප්‍රකට කන්ඩායමක් දෙමල මාධ්‍යවේදියාගේ ඝාතනය පිලිබඳ වගකීම බාර ගනී” යන මැයෙන් මැයි 25 දා (ඉංග්‍රීසි භාෂාවෙන්) ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල වූ ලිපිය සම්බන්ධයෙන් සිදු කෙරුනු ලිපි හුවමාරුවකි.*

කර්තෘ වෙත,

මෙම ප්‍රවෘත්ති වාර්තාවේ පෙන්නුම් කෙරුනු නොසැලකිලිමත් මාධ්‍ය භාවිතය මා තරමක් මවිතයට පත් කලේ ය. මා ජාතික හෙල උරුමය මගින් වැලඳගනු ලැබ ඇති ආන්තික ජාතිකවාදයේ ආධාරකරුවකු නොවන නමුත් “. . . ජවිපෙ හා ජාතික හෙල උරුමය යන දෙපාර්ශ්වයට ම වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියා හා ඝාතන සම්බන්ධයෙන් වාර්තාවක් පවතී” යැයි ඔහු/ඇය සඳහන් කරන විට, ඔබගේ ඊනියා *වාර්තාකරු” කියා පාන පරිදි, හෙල උරුමය මොන යම් ආකාරයක හෝ වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියාවල හා ඝාතනවල නිරතව ඇතැයි කියාපෑම මුලුමනින් ම අසාධාරන, සාවද්‍ය හා වගකීම් විරහිත ක්‍රියාවකි. මෙය අවලාදාත්මක ප්‍රකාශයකි, මේ ආකාර ප්‍රකාශයක සාමාන්‍ය ප්‍රතිඵලය විය හැක්කේ ලිඛිත අපහාසයට එරෙහි නෛතික ක්‍රියාමාර්ගයකි. ඔබගේ වාර්තාකරු ජාතික හෙල උරුමය යන නම පරිවර්තනය කරන්නේ ද “ශුද්ධ සිංහල ජාතික උරුමය” ලෙස යි. යලිත් මෙය ද මුලුමනින් ම සාවද්‍ය පරිවර්තනයකි. ජාතික හෙල උරුමය පරිවර්තනය කෙරෙන්නේ “ජාතික ශ්‍රී ලාංකික උරුමය” ලෙස යි. එම නමේ කිසිදු තැනක “ශුද්ධ සිංහල” පිලිබඳ සඳහනක් නැත.

කරුනාකර ඔබගේ වාර්තාකරුවන් ඉහල ප්‍රමිතියක වෘත්තිමය මට්ටමක් පවත්වා ගෙන යන බවට ද මුල් බැස ගත් අවශ්‍යතාවන්ගේ බලපෑමට හසු නොවන බවට ද සහතික කර ගන්න.

එම්.ඩබ්ලිව්.

හිතවත් එම්.ඩබ්ලිව්.,

ප්‍රවෘත්ති මාධ්‍ය බොහොමයකට -- විශේෂයෙන් ම කොලඹ සිට ක්‍රියාත්මක වන -- ප්‍රතිකූල ලෙස, ලෝක සමාජවාදී වෙබ් අඩවිය, නිවැරදි වාර්තාකරනය පිලිබඳ ප්‍රශ්නය අතිශයින් ම බැරෑරුම්ව සලකයි.

ලෝක සමාජවාදී වෙබ් අඩවියට ඔබ එවූ ඊ-මේල් ලිපිය තුල, ප්‍රසිද්ධ දෙමල මාධ්‍යවේදී ධර්මරත්නම් සිවරාම් අමු අමුවේ ඝාතනය කිරීම පිලිබඳ අපගේ මෑතම වාර්තාවට ඔබ දක්වන එකම විරුද්ධත්වය එල්ල වන්නේ, ජාතික හෙල උරුමයේ වාර්තාව පිලිබඳ අපගේ ගුනාංගීකරනයටයි. ඔබ “ජාතික හෙල උරුමය මගින් වැලඳගනු ලැබ ඇති ආන්තික ජාතිකවාදයේ ආධාරකරුවකු නොවන” බව පවසන නමුත් ඔවුන්ගේ වර්ගෝත්තමවාදී දේශපාලනයේ හා ප්‍රකෝපකාරී ක්‍රියාවල බලපෑම ගැන හෝ ඇත්ත වසයෙන් ම අපරාධය ම පිලිබඳව ඔබ කිසිදු අදහස් දැක්වීමක් නො කරයි.

අවංකව ම කිව හොත්, සිවරාම් ඝාතනයට අනතුරුව හෙල උරුමය නිකුත් කල ප්‍රකාශය බියකරු ය. “ටැමිල්නෙට් වෙබ් අඩවියේ සංස්කාරකගේ ඉරනම රටේ සාමයට එරෙහි වන අන්තවාදීන්ගේ අනාගත ඉරනම පිලිබඳ හොඳම නිදසුනයි” යනුවෙන් එය සඳහන් කරයි -- මෙය වනාහි තව දුරටත් වර්ගෝත්තමවාදී ඝාතන විවෘතව ම දිරිගන්වන ප්‍රකාශයකි. එහෙත් එය විරෝධය පෑ යුතු ප්‍රකාශයක් ලෙස ඔබ සලකන බවක් නොපෙනෙයි.

හෙල උරුමයේ ප්‍රකාශය එහි සෙසු ක්‍රියාකාරකම් සමග ගැලපෙන එකකි. සිහල උරුමය සහ ජාතික සංඝ සම්මේලනයේ කොටසක් විසින් පසුගිය වසරේ මහ මැතිවරනයට යන්තම් පෙරාතුව හෙල උරුමය පිහිටුවන ලදි. එහි වැඩපිලිවෙල බෞද්ධ මූලධර්ම මත ගොඩනැගෙන රාජ්‍යයක් සඳහා කැඳවුම් කරන අතර අන් සියල්ලට ම ඉහලින් “සිංහල ජාතියේ ජාතික අයිතිය” අවධාරනාත්මකව කියාපායි. මෙම පදනම මත, එය, සාම සාකච්ඡාවලට හෝ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට කිසියම් සහනයක් දීමට

-- සීමිත සහනයකට පවා -- ප්‍රබල විරුද්ධත්වයක් දක්වා ඇති අතර සුනාමියෙන් විපතට පත් ජනතාවට ආධාර ලබා දීම පිනිස එල්ටීටීඊය සමග ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීමට එරෙහිව, ජවිපෙ වැනි සෙසු ස්වෝත්තමවාදී සංවිධාන හා එක්ව, දුෂ්ට වර්ගෝත්තමවාදී උද්සෝෂනයක මේ දැන් යෙදී සිටී.

ඔබ මතු කරන සුවිශේෂ විරුද්ධත්වය සම්බන්ධයෙන් සැලකූ කල, හෙල උරුමයේ සහ එහි පූර්වගාමීන්ගේ වර්ගෝත්තමවාදී ප්‍රචන්ඩ ක්‍රියාවල වාර්තාවට හෝ සිවරාම් ඝාතනය වැනි සාහසික අපරාධ සිදු විය හැකි දේශපාලන වාතාවරනය නිර්මානය කිරීමෙහි ලා එයට පවත්නා වගකීමට සැඳහුම් කිරීම මුලුමනින් ම අසාධාරන හෝ සාවද්‍ය නො වේ. නිදසුන් කිහිපයක් පමනක් සඳහන් කල හොත්:

* 2003 සැප්තැම්බර් හා ඔක්තෝබර් කාලයේ දී ජාතික සංඝ සම්මේලනය හා සිහල උරුමය, බෞද්ධ නටබුන් පරීක්ෂා කිරීමට හා මනිරාසකුලම්හි එල්ටීටීඊ මිලිටරි කඳවුරු ඉවත් කරන ලෙස ඉල්ලා සිටීමට නැගෙනහිර පලාතේ ප්‍රකෝපකාරී උද්සෝෂන සංවිධානය කලේ ය. ප්‍රචන්ඩ ගැටුමක් හා වඩා පුලුල් වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියා අවුලුවාලීමේ තර්නජය මතු කරමින්, එල්ටීටීඊයට ඍජුව ම ප්‍රතිමුඛ කිරීමේ එල්ලයෙන් යුත් ඔවුන්ගේ දෙවන පාගමන වලකාලීමට ආරක්ෂක හමුදා යැවීමට එජාපෙ ආන්ඩුවට බල කෙරුනි.

* 2003 වසරේ දී, මෙම සංවිධාන දෙක, ක්‍රිස්තියානි කන්ඩායම් විසින් සිදු කෙරෙන ඊනියා සදාචාර විරෝධී ආගම් මාරුකිරීම් තහනම් කරන ප්‍රජාතන්ත්‍ර විරෝධී නීතියක් පනවන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටිනු පිනිස උද්සෝෂනයක් දියත් කලේ ය. ගංගොඩවිල සෝම භික්ෂුව 2003 දෙසැම්බරයේ දී රුසියාවට කල සංචාරයක් අතරතුර දී මිය යාමෙන් පසුව මෙම උද්සෝෂනය උත්සන්න කරන ලදි. කිසිදු සාක්ෂියකින් තොරව, සිහල උරුමය හා ජාතික සංඝ සම්මේලනය කියා සිටියේ, මෙම භික්ෂුවගේ අභාවය ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ කුමන්ත්‍රනයක ප්‍රතිඵලයක් බවයි.

මෙම උද්සෝෂනය තුල දී, කොලඹ, එය අවට උපනගර හා සෙසු ප්‍රදේශවල පිහිටි ක්‍රිස්තියානි පල්ලි 100කට අධික සංඛ්‍යාවකට ප්‍රහාර එල්ල කෙරුනි. කලින් දැන නොසිටි කන්ඩායම් ගනනාවක් ම මේ ප්‍රහාර ගැන වගකීම භාර ගැනීමට ක්ෂනිකව ඉස්මතු විය. දැන් සිවරාම් ඝාතනය කල බව කියාපාන ෆෙරපුත්තාහය බලකාය ඉන් එකකි. ඇත්ත වසයෙන් ම, සිහල උරුමයේ සාමාජිකයන් මේ ක්‍රියාවන්ට සම්බන්ධ බවට මාධ්‍ය වාර්තා මගින් පෙන්නුම් කල විට, තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව සිහල උරුමය ප්‍රකාශ කලේ ය. එහෙත් එහි උද්සෝෂනය මෙම ප්‍රචන්ඩ ප්‍රහාර දිරිගැන්වී ය යන කරුන එයට ප්‍රතික්ෂේප කල නො හැකි ය.

* 2003 ඔක්තෝබර් 29 දා, සිහල උරුමය විසින් දිරිගන්වන ලද සිංහල ස්වෝත්තමවාදී නඩයක්, කොලඹ නව නගර ශාලාවේ පැවති සිංහල හා දෙමල කලාකරුවන් සහභාගි වූ සංස්කෘතික උලෙලකට ප්‍රහාරයක් එල්ල කලේ ය. එහි දී සහභාගි වූවන්ගෙන් ගනනාවක් ම තුවාල ලැබූහ. සිහල උරුමය එම ක්‍රියාවට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව ප්‍රකාශ කල නමුදු, එහි නියෝජ්‍ය ලේකම් නිශාන්ත වර්නසිංහ සහ ජාතික සංඝ සම්මේලනයේ ප්‍රමුඛ සාමාජිකයකු වූ හැඩිගල්ලේ විමලසාර මැර නඩයේ කොටස්කරුවෝ වූහ.

* සිහල උරුමය හා ජාතික සංඝ සම්මේලනය ජාතික හෙල උරුමය බවට පත්වීම පිනිස ඒකාබද්ධ වීමෙන් පසුව එම විධික්‍රමයන් අඛන්ඩව පවත්වාගෙන යාම පුදුමයක් නො වේ. දෙසැම්බර් 11 දා බොලිවුඩ් තාරකාවක් වන ශාරුක් ඛාන් වෙනුවෙන් සංවිධානය කර තිබූ සංගීත සංදර්ශනය අසල පැවති ප්‍රකෝපකාරී විරෝධතා ව්‍යාපාරය සම්බන්ධයෙන් ජාතික හෙල උරුමය ඍජුව වගකිව යුතු විය. එම විරෝධතාව අවසන් වූයේ දෙදෙනෙකුට මරු කැඳවමින් හා තවත් ගනනාවකට තුවාල සිදු කරමින් ප්‍රේක්ෂකයන් දෙසට බෝම්බයක් විසි කිරීමෙනි.

හෙල උරුමය, එම ප්‍රසංගය ගංගොඩවිල සෝමගේ අභාවයේ සංවත්සරය සමග එකට වැටේ යන ව්‍යාජ හේතුව මත එය අවලංගු කල යුතු යැයි ඉල්ලමින්, දෙසැම්බර් 2 දා උද්සෝෂනයක් දියත් කලේ ය. සෝම හිමි චින්තන පදනම නම් වූ පෙරමුනු සංවිධානයක්, උත්සවයට දින දෙකකට පෙර බෞද්ධ භික්ෂූ කන්ඩායමක් සහභාගි වූ උපවාසයක් ද උත්සවය පැවති දින ඒ අසල ම විරෝධතා ව්‍යාපාරයක් ද සංවිධානය කලේ ය. ප්‍රසංග භූමියට කඩා වැදීමට තැත් කල විරෝධතාකරුවන් ගනනාවක් පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදි. මෙම ගැටුමට ඉනික්බිතිව ප්‍රේක්ෂක පිරිස දෙසට බෝම්බය විසි කරන ලදි. හෙල උරුමය සිය වගකීම ප්‍රතික්ෂේප කල නමුත්, එය ප්‍රහාරය සඳහා දේශපාලන කොන්දේසි නිර්මානය කොට තිබුනි.

මේ සම්බන්ධයෙන් හෝ ඊට පෙර සිදු වූ අපරාධ එකක් වත් සම්බන්ධයෙන් හෝ කිසිවකුට එරෙහිව චෝදනා ගොනු කොට හෝ කිසිවකු වරදකරු කොට නැත. පොලිස් හමුදාවන් තුල පැතිර පවත්නා ස්වෝත්තමවාදී ආකල්පයන් යටතේ මෙය පුදුමයට කරුනක් නො වේ. හෙල උරුමයේ එකදු සාමාජිකයකුට හෝ නායකයකුට එරෙහිව මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් චෝදනා ගොනු කොට හෝ ඔවුන් කිසිවකු වරදකරුවකු කොට නැත. ඒ නිසයි, අතිශය නිරවද්‍යතාව රැකගනු වස්, "ජවිපෙ හා ජාතික හෙල උරුමය යන දෙපාර්ශ්වයට ම වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියා හා ඝාතන සම්බන්ධයෙන් වාර්තාවක් පවතී" යන වාක්‍යංශයෙන් "හා ඝාතන"

යන කොටස අප විසින් ඉවත් කරගනු ලැබ ඇත්තේ. ජවිපෙ සම්බන්ධයෙන් ගත් කල, 1980 ගනන් අග දී සිය දේශපාලන විරුද්ධවාදීන් බුරුතු පිටින් ඝාතනය කිරීමට එය සෘජුව ම සමබන්ධ විය. සිවරාම්ගේ ඝාතකයන්ට ජවිපෙට හෝ හෙල උරුමයට යම් සම්බන්ධතාවක් තිබීමට සෑහෙන ඉඩක් පවතී.

ජාතික හෙල උරුමයේ නමට අප යෙදූ පරිවර්තනය පිලිබඳ ඔබගේ කෙස් පලන තර්කය සම්බන්ධයෙන් ගත් කල, “හෙල” යන වචනය යොදා ගැනීම, හෙල උරුමය ශුද්ධ සිංහල සංවිධානයක් බවට අදහස් කරමින්, නිශ්චිත වර්ගවාදී සහජාස භාවයක් ඇති කරයි. ඔබ ජාතික හෙල උරුමය “ජාතික ශ්‍රී ලාංකික උරුමය” ලෙස පරිවර්තනය කරන අතර අන් අය “ජාතික සිංහල උරුමය” යන නම යොදා ගනී. අප එහි නියම අරුත දීමට උත්සාහ කර තිබේ. ඇත්ත වසයෙන් ම අපට සිංහලයේ අතිශය සියුම් වෙනස්කම් ගැන වාද කල හැකි ය. එහෙත් එය ලිපියේ අඩංගු දේශපාලන තර්ක වෙනස් කිරීමට කිසිසේත් දායක නො වේ.

ඉහත කරුනු “එල්ටීටීඊ-ගැති” ප්‍රකාශ ලෙස සරලව ම නො තකා හැරීමට ඔබ යොමු වුව හොත්, පහත කරුන පෙන්වා දීමට මට ඉඩ දෙනු මැනවි: එනම්, එල්ටීටීඊයට හා එහි ජාතිකවාදී වැඩපිලිවෙලට විරුද්ධ වීමේ දිගු කාලීන වාර්තාවක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* හා ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයට පවතින බව යි. අව්‍යාජ සමාජවාදීන් ලෙස, අපි සෑම ආකාරයක ම ජාතිකවාදයන්ට හා ස්වෝත්තමවාදයන්ට සතුරු වන අතර ස්වකීය ස්වාධීන පන්ති අවශ්‍යතා උදෙසා සටන් කරනු පිනිස, ආගම, ජන වර්ගය හෝ භාෂාව නො තකා, වැඩ කරන ජනතාවගේ එකමුතුව වෙනුවෙන් පෙනී සිටිමු. මෙම පිලිවෙත ශ්‍රී ලංකාවේ අන් සියලු දේශපාලන පක්ෂවලින් හා ප්‍රවනතාවන්ගෙන් ද ශ්‍රී ලංකාවේ ජීවිතයේ සෑම අංශයකට ම විෂ කවන සහ කම්කරු පන්තිය එක ව්‍යසනයකින් පසුව තව ව්‍යසනයකට ඇද දමා ඇති ඔවුන්ගේ වර්ගවාදී දේශපාලනයෙන් ද අප වෙන් කර තබයි.

මෙයට හිතවත්,

කේ. රත්නායක,
*ලෝක සමාජවාදී වෙබ් අඩවිය.*

© www.wsws.org